පිළියන්දල අධ්‍යාපන කලාපය
Piliyandala Education Zone

| | |
|---|---|
| 9 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2025 |
| ඉතිහාසය I , II | පැය දෙකයි<br>Two Hours |
| නම :- | |

## I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) පෘතුගාලයේ රජ වූ දෙවන පිලිප් රජතුමා ලන්දේසීන්ට පැමිණීමට තහනම් කළ වරාය වන්නේ,

(i) ලන්ඩන් (ii) ලිස්බන් (iii) කයිරෝ (iv) කොන්ස්තන්තිනෝපල

(02) ලන්දේසීන්ගේ පෙරදිග වෙළඳ මධ්‍යස්ථානය වූයේ,

(i) සුමාත්‍රා දූපතේ බතාවිය (ii) මලයාවේ බතාවිය

(iii) ඉන්දියාවේ බතාවිය (iv) ජාවා දූපතේ බතාවිය

(03) ජොරිස් වැන් ස්පිල්බර්ජන් සම්බන්ධ නිවැරදි පිළිතුර තෝරන්න.

(i) 1602 දී මඩකපුවට ගොඩ බැස්සේ ය.

(ii) 1602 දී කොළඹට ගොඩ බැස්සේ ය.

(iii) 1505 දී මඩකපුවට ගොඩ බැස්සේ ය.

(iv) 1658 දී මඩකපුවට ගොඩ බැස්සේ ය.

(04) හැකිතරම් සාමකාමීව උඩරට රජුන් සමඟ සිටීමට ලන්දේසීන් තීරණය කළේ,

(i) උඩරට හමුදාවට මුහුණදීමට ලන්දේසීන්ට අවි ආයුධ නොතිබූ නිසයි.

(ii) ලන්දේසීන් ගේ යුධ ශක්තිය දුර්වල වූ නිසයි.

(iii) පෘතුගීසීන්ට මෙන් කෙළවරක් නැති යුද්ධවලට පැටලීමට සිදුවන නිසයි.

(iv) II රාජසිංහ රජුගේ හමුදාව දුර්වල වූ නිසයි.

(05) දෙවන රාජසිංහ රජුගේ පුත්‍රයා වූයේ,

(i) දෙවන විමලධර්මසූරිය (ii) පළමු විමලධර්මසූරිය

(iii) වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ (iv) සීතාවක රාජසිංහ

- 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරාගෙන හිස්තැනෙහි ලියන්න.

( හුෆ්ට්මන් / අනුමිල්දාර්වරු / ලැන්රාද් / ඔපර් හුෆ්ට් / රොබට් ඇන්ඩෲස් )

(06) ශ්‍රී ලංකාවේ ලන්දේසීන්ගේ ඉඩම් උසාවිය .................................................. නමින් හඳුන්වන ලදි.

(07) 1795 උඩරටට පැමිණි .................................................. ඉංග්‍රීසි දූතයෙකි.

(08) .................................................. ලෙස ලන්දේසි පාලන සමයේ හැඳින්වූයේ ඉඩම් ආදායම් භාර නිලධාරියා ය.

(09) ඉංග්‍රීසි පාලන සමයේ වෙරළබඩ ප්‍රදේශවල බදු එකතුකිරීමට .................................................. නම් නිලධාරි පිරිසක් විය.

(10) ශ්‍රී ලංකාවේ ලන්දේසි පාලනයේ දී ජ්‍යෙෂ්ඨ වෙළෙන්දා හඳුන්වන ලද්දේ .................................................. නමිනි.

- 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු හිස්තැන මත ලියන්න.

(11) අග්නිදිග ආසියාවට මුහුණලා පිහිටා ඇති ලංකාවේ ස්වභාවික වරාය නම් කරන්න.

..................................................

(12) උඩරට රජුන් හමුවීමට පැමිණි ඉංග්‍රීසි දූතයන් අතරින් පළමුවෙන් ම උඩරටට පැමිණ කීර්ති ශ්‍රී රාජසිංහ රජු හමු වූ දූතයා ..................................................

(13) 1815 ට පෙර උඩරට ආක්‍රමණයක් කරමින් මුත්තුසාමි කුමරු උඩරට රජු හැටියට ප්‍රකාශ කළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා ..................................................

(14) රජෙකු අභිෂේකයෙන් හටගත් කලකිරීම හේතුවක් බවට පත්වූයේ කිනම් නිදහස් සටනක ද?

..................................................

(15) මාසික තැග්ග කුමන මිෂනාරි සමාගමක ප්‍රකාශනයක් ද? ..................................................

- 16 සිට 20 දක්වා දී ඇති ප්‍රකාශ හොඳින් කියවා ඒවා නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද දී ඇති වරහන තුළ යොදන්න.

(16) ඉංග්‍රීසීන්ගේ පාලන සමයේ ලංකාවේ මිෂනාරි කටයුතු වඩාත් පහසු වූයේ රාජ්‍ය අනුග්‍රහය ලැබුණ නිසාය. ( )

(17) රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමියෝ පරමධම්ම චේතිය පිරිවෙන පිහිටුවන ලදි. ( )

(18) බාල පාඨම් නම් පෙළපොත් රචනා කළේ හින්දු පුනරුදයට සම්බන්ධ අරුමුග නාවලර්තුමා ය. ( )

(19) සිපොයි කැරැල්ල හටගැනීමට ප්‍රබල හේතුවක් සැපයුවේ පතුරොම්වල ග්‍රීස් තැවරීමේ දී ඌරු තෙල් හා තල තෙල් මිශ්‍ර කිරීමයි. ( )

(20) ඉන්දියාවේ උසස් ධනවත් පවුලක උපන් මහත්මා ගාන්ධි තුමා දකුණු අප්‍රිකාවේ ඉගෙන ගෙන එහිම සේවය කර 1915 දී ඉන්දියාවට පැමිණියේ ය. ( )

(ල. 2 x 20 = 40)

# 9 ශ්‍රේණිය - ඉතිහාසය

## II කොටස

- පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවීම අනිවාර්යය වේ.
- 01 ප්‍රශ්නයේ අ, ආ, ඇ, ඉ යන කොටස් හතර සඳහාම පිළිතුරු ලියන්න.
- 2, 3, 4, 5, 6, 7 යන ප්‍රශ්නවලින් කැමති ප්‍රශ්න **4** ක් තෝරාගෙන පිළිතුරු ලියන්න.
- නිවැරදිව ප්‍රශ්න අංක, අනු අංක යෙදීම පිළිබඳව සැලකිලිමත් වන්න.

(01) අ) (i) රූපයෙන් දැක්වෙන ගොඩනැගිල්ල කුමක්ද ?

(ii) එය පිහිටි රාජධානිය කුමක් ද?

(ල. 2 X 2 = 4)



ආ) (i) රූපයෙන් දැක්වෙන්නේ කවුද ?

(ii) කිනම් රජකෙනෙකු හා සම්බන්ධ වේද ?

(ල. 2 X 2 = 4)



ඇ) (i) රූපයෙන් දැක්වෙන්නේ කවු ද?

(ii) මෙම භික්ෂූන් වහන්සේ ආරම්භ කළ ප්‍රසිද්ධ පිරිවෙන නම් කරන්න.

(ල. 2 X 2 = 4)



ඉ) (i) ඉන්දියානු සිතියමේ,

A. ගෝව　　B. බොම්බාය

C. කැලිකට්　　D. මද්‍රාසිය

නගර හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අකුරු සිතියමේ අදාළ ස්ථානයේ ලියන්න.

(ල. 4)



(02) (i) උඩරටට ගිය ලන්දේසි දූතයන් රජුට ලබාදුන් තෑගිබෝග අතරින් 2 ක් ලියන්න. (ල. 2)

(ii) උඩරට රජුන් හමුවීමට ගිය ලන්දේසි දූතයන් සතර දෙනෙක් නම් කරන්න. (ල. 4)

(iii) ලංකාවෙන් පෘතුගීසීන් පලවාහැරීම පිළිබඳ වැදගත් තොරතුරු ඇතුළත් කරමින් විස්තර කරන්න. (ල. 5)

(03) (i) 1638 ගිවිසුම පරිදි පෘතුගීසීන්ගෙන් අල්ලාගත් බලකොටු අතරින් උඩරට රජුට ලන්දේසීන් භාර නොදුන් බලකොටු 2 ක් නම් කරන්න. (ල. 2)

(ii) ජෙරාඩ් හල්ෆ්ට් සෙනෙවියාට දෙවන රාජසිංහ රජු ගෞරව දැක්වූයේ ඇයි කෙටියෙන් ලියන්න. (ල. 2)

(iii) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ සේවාවන් පිළිබඳව වැදගත් තොරතුරු ඇතුළත් කරමින් විස්තර කරන්න. (ල. 5)

(04) (i) 1797 වෙරළබඩ ප්‍රදේශවල ඇති වූ කැරැල්ලට හේතු වූ නව බදු වර්ග 2 ක් ලියන්න. (ල. 2)

(ii) ඉංග්‍රීසි පාලන කාලයේ ද්විත්ව පාලනයට එම නම ලැබුණ ආකාරය කෙටියෙන් ලියන්න. (ල. 4)

(iii) ඉංග්‍රීසීන්ට උඩරට අල්ලා ගැනීම සඳහා විශාල මෙහෙවරක් ඉටුකළ සිවිල් සේවා නිලධාරියා ගැන වැදගත් කරුණු ඇතුළත් විස්තරයක් ලියන්න. (ල. 5)

(05) (i) ඉංග්‍රීසි පාලන සමයේ ලංකාවේ බෞද්ධ පුනරුදයේ පුරෝගාමී චරිත 2 ක් නම් කරන්න. (ල. 2)

(ii) හින්දු ආගමික පුනරුද සමයේ පූජකයෙක් වූ ආරුමුග නාවලර් තුමන්ගේ සේවාවන් 2 ක් ලියන්න. (ල. 4)

(iii) ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි පාලන සමයේ ආගමික පුනරුදය කාලයේ ඉස්ලාම් ආගමික නායකයන් එහි පැවැත්ම වෙනුවෙන් ගත්තා ලද ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ල. 5)

(06) (i) කන්ද උඩරට පළමු නිදහස් සටනට සම්බන්ධ නායකයෝ දෙදෙනෙක් නම් කරන්න. (ල. 2)

(ii) කන්ද උඩරට පළමු නිදහස් සටන ඇතිවීමට හේතු 2 ක් කෙටියෙන් ලියන්න. (ල. 4)

(iii) කන්ද උඩරට දෙවන නිදහස් සටන අසාර්ථක වීමට බලපෑ හේතු දක්වමින් විස්තරයක් ලියන්න. (ල. 5)

(07) (i) ඉංග්‍රීසිහු ඉන්දියාවේ වෙළඳ ගබඩා පිහිටුවාගත් ස්ථාන 2 ක් ලියන්න. (ල. 2)

(ii) ඉන්දියාවේ අභ්‍යන්තර ප්‍රදේශ තමන් සතුකරගැනීමට ඉංග්‍රීසීන් කටයුතු කළ ආකාර 2 ක් ලියන්න. (ල. 4)

(iii) 1857 හටගත් ඉන්දියානු ස්වදේශික භටයන් ඇතිකළ කැරැල්ලට බල පෑ හේතු පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)